# තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

එස්.ඒ.එස්.එස්. පෙරේරා,
අංක 66,
දෙවන පටුමග,
වේරගල,
පාදුක්ක.

අභියාචක

**අභියාචනා අංකය : 1010/2021**

එදිරිව

ශ්‍රී ලංකා පොලිස් මූලස්ථානය,
කොළඹ - 01.

පොදු අධිකාරිය

| | | | |
|---|---|---|---|
| **ඉදිරිපිටදී** | : | 1. විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික) | - සභාපති |
| | | 2. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන | - කොමසාරිස් |
| | | 3. නීතිඥ ජගත් ලියන ආරච්චි | - කොමසාරිස් |

**පෙනී සිටීම** : අභියාචක නැත.
පොදු අධිකාරිය වෙනුවෙන් පොලිස් පරීක්ෂක එච්.එම්.කේ.බී හේරත් මයා පෙනී සිටී.

| | | | |
|---|---|---|---|
| **ලිඛිත සැළකිරීම්** | : | අභියාචක | - ඉදිරිපත් කර නොමැත. |
| | | පොදු අධිකාරිය | - ඉදිරිපත් කර නොමැත. |

**විභාග කළ දිනය** : 2022.05.25, 2022.08.17

**තීරණය කළ දිනය** : 2022.08.17

**කොමිෂන් සභාවේ තීරණය :**

**අභියාචනයට පසුබිම්වූ කරුණු**

අභියාචක විසින් 2020.07.21 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත සඳහන් තොරතුරු ඉල්ලා ඇත.

> *"වේරගල ආරක්ෂක කමිටු සභාපතිවරයා ඔහුගේ නිලනාමය භාවිත කරමින් මා සම්බන්ධයෙන් ගරු අධිකරණයට අසත්‍ය කරුණු වාර්තා කිරීමක් සම්බන්ධව ලි.ප.තැ.අංක 4205-පාදුක්ක යටතේ 2020.06.03 වන දින ඉහත සඳහන් මා විසින් කරන ලද පැමිණිල්ල සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග"*

තොරතුරු නිලධාරි පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2020.08.14 දිනැතිව නම්කළ නිලධාරි වෙත අභියාචනයක් යොමු කර ඇත. නම්කළ නිලධාරි ද පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2020.09.09 දිනැතිව කොමිෂන් සභාව වෙත ඉහත අංක දරණ අභියාචනය යොමු කර ඇත.

තොරතුරු දැනගැනීමේ පනතේ 24(3) හා 25 (1) වගන්තියේ සඳහන් පරිදි සිය ව්‍යවස්ථාපිත වගකීම තොරතුරු නිලධාරි විසින් ඉටුකර නොමැති බවත්, නම්කළ නිලධාරිද පනතේ 31(2) හා 31(3) වගන්තියේ සඳහන් පරිදි සිය ව්‍යවස්ථාපිත වගකීම ඉටුකර නොමැති බවත් කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටී.

**සලකා බැලීම**

මෙම තොරතුරු ඉල්ලීම තමන් වෙත ලැබී නොමැති බව පොදු අධිකාරියේ ස්ථාවරය විය. ඒ සම්බන්ධව වැඩිදුර කරුණු සොයා බැලීමට අද දිනට විමර්ශනය කල් තබා ඇත. කෙසේ වෙතත්, තොරතුරු ඉල්ලීම පොදු අධිකාරිය වෙත යැවීම සම්බන්ධව දැනටමත් ඉදිරිපත් කර ඇති කරුණු හැර අතිරේක කරුණු ඉදිරිපත් කිරීම සඳහා අභියාචක පැමිණ නැත.

කෙසේ වෙතත්, දැන් තොරතුරු ඉල්ලීම ගැන අවබෝධයක් පොදු අධිකාරියට ඇති බැවින් එකී තොරතුරු අභියාචක වෙත මුදා හැරීමට හැකියාව ඇති බව අද දින පරීක්ෂණයට සහභාගි වන පොලිස් පරීක්ෂක එච්.එම්.කේ.බී හේරත් මහතා සඳහන් කරයි.

ඒ අනුව ඉහත කරුණු සළකා බලා උක්ත සඳහන් තොරතුරු ඉල්ලීමට අදාළ තොරතුරු 15.09.2022 දිනට ප්‍රථම, මෙම කොමිෂන් සභාවට පිටපත් සහිතව, අභියාචක වෙත මුදා හැරීමට පොදු අධිකාරිය ක්‍රියා කළ යුතු බවට තීරණය කරමු.

එසේ තොරතුරු ලබා දීමට පොදු අධිකාරිය අපොහොසත් වන්නේ නම් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 39 වගන්තිය ප්‍රකාරව පොදු අධිකාරියට සහ තොරතුරු නිලධාරිට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරිය යුතු බවටද වැඩිදුරටත් තීරණය කරමු.

මෙම තීරණය පොදු අධිකාරිය, තොරතුරු නිලධාරි සහ අභියාචක වෙත දැනුම් දීමට මෙම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා මෙහෙයවනු ලැබේ.

අභියාචනය අවසන් කරන ලදී.